

## 17

රන් කහවනු පොදි සිතිඳු කසී සළු
එපා එපා ජේසු
මිණි මුතු අහරණ දිලෙන කසුන් වැල්
සොයන්නෙ නැහැ ජේසු

වෙහෙසුණු හදකට සැනසුම දෙන්නට
යුතුමග සොයන්නෙමි
දුබලවූ සිතකට සවියක් දෙන්නට මගෙ සිත යොදන්නෙමි
රසයෙන් සපිරුණු මිහිරි රජ බොදුන් එපා එපා ජේසු
සුවයෙන් සුවදෙන සුවඳ මල් යහන්
සොයන්නෙ නැහැ ජේසු

කුසයට අහරක් නොලැබ විඳින දුක
දැක පෙර මගට යමි
ඇඳිවත අහිමිව සලන කඳුළු පිස සනසා ඉවත යමි
රන් සිහසුන් මත වැජඹෙන තනතුරු එපා එපා ජේසු
හිස සරසන්නට කුමර පළඳනා
සොයන්නෙ නැහැ ජේසු

පාලු මගේ හද ජේසුට වඩිනට සුව අසුනක් කරමි
දිළිඳු මගෙ සිත ජේසුගේ සුදු හිත සමගින් එක් කරමි
රන් කහවනු පොදි සිතිඳු කසී සළු එපා එපා ජේසු
මිණි මුතු අහරණ දිලෙන කසුන් වැල්
සොයන්නෙ නැහැ ජේසු //